# ගොවි කටයුතු වලදී දක්වුනු අදහස් ගැන අපේ නිරීක්ෂණ

''ගොවි කටයුතුවලදී දක්වුණු අදහස් කෙටියෙන්'' යන මාතෘකාව යටතේ ඒ ඒ දිස්ත්‍රික්කවලදී අපට මුන ගැහුන ගොවි මහත්වරු ඉදිරිපත් කළ ප්‍රශ්න කීපයක් ''ගොවි ජනතාව'' සහරාවේ පසුගිය කලාප දෙකේ ඇතුළත් කර තිබුනා. ඒ ප්‍රශ්න වලින් සමහරකට පිළිතුරු පහත දක්වා ඇත. ඉතිරි ප්‍රශ්නවලට පිළිතුරු ඉදිරි කලාපවල ඇතුළත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

## උදලු හිඟය.

උදලු ලබා ගැනීමට ඇති අමාරුකම ගැන බොහෝ විට ගොවි මහත්වරු ඉතා ඕනෑ කමින් අප සමග කරුණු කියා සිටිය. මේ ප්‍රශ්නය අපි රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවට ඉදිරිපත් කළා. එම සංස්ථාවේ අලෙවි කළමනාකාර මහතා කියාපු හැටියට උදලු හිඟය යනුවෙන් කවුරුත් සාමාන්‍යයෙන් අදහස් කළේ කිඹුලා උදලු හිඟකමයි. මේ හිඟකම මඟ අරවන්න පසුගිය දවස්වල කිඹුලා උදළු 50000 ක් පිට රටින් ගෙන්නල ස.තො.ස. මගින් බෙද හැර තිබෙනවා. දැනට 8''X10'' උදලු තල 35,000 කුත්, 7''X10'' උදලු තල 5000 කුත් සංස්ථාව මගින් නිපදවනවා. රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව කියන හැටියට මේ ප්‍රමාණය දැනට ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනයට ඇති. හුඟක් ගොවි මහත්වරු 9''X9'' සහ 10''X10'' උදලු වලට පුරුදු වෙලා ඉන්න නිසා ලඟදීම මේ උදලු වර්ග දෙක නිපදවන්නත් සංස්ථාව කටයුතු කරගෙන යනවා.

පෝර උදලු නොහොත් මඩ උදලු යන නමින් හැඳින්වෙන පළල් තලයක් තිබෙන බර උදලු වර්ගයකුත් වෙළඳ පොලේ තිබෙනවා. සංස්ථාවේ අනුදැනීමක් නැතිව මේ උදලු නිෂ්පාදනය කරන්නේ ගොඩේ කම්හල්වල. එම නිසා ඒ උදලු ගැන කිසිම වගකීමක් බාර ගැනීමට සංස්ථාවට පුළුවන් කමක් නැති බව පැහැදිලියි.

## සමුපකාර සමිතිවල අයහපත් ක්‍රියාකාරිත්වය

බොහෝ සමුපකාර සමිති වලින් ගොවි මහත්වරුන්ට ලැබෙන සේවය සතුටුදායක නොවන බව නිතරම අපට අසන්නට ලැබෙන කාරණයක්. සමහර පළාත්වල තිබෙන සමුපකාර සමිති වලින් සතුටුදායක සේවයක් ලැබෙන බව අපට අසන්නට ලැබෙන අවස්ථාවලුත් තිබෙනවා. කෙසේ වෙතත්, මේ ගැන අපි සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසා බැලුවා. ශ්‍රී ලංකාවේ හැම ගමකම වගේ පිහිටුවා තිබෙන සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩලවලට පත් කරනු ලැබ සිටින්නේ ඒ ඒ ගම්වල සිටින අය. එම සමුපකාර සමිති පාලනය කරනු ලබන්නේත්, ඒවාට සේවකයින් පත් කරන්නේත් අධ්‍යක්ෂ මණ්ඩල විසින්. එම නිසා ඒ ඒ සමුපකාර සමිති වලින් ඉටු කරන සේවය යහපත් එකක් කර ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලවලට භාර කටයුත්තක්. යම්කිසි සමුපකාර සමිතියක සේවය අසතුටු දායක නම් ඒ ගැන අධ්‍යක්ෂ මණ්ඩලයට පැමිණිලි කර සිටීමට සාමාජිකයින් හට බලය තිබෙනවා. ඒ වගේම තමන්ගේ සමිතියේ වැඩ කටයුතු සතුටුදායක ලෙස පවත්වාගෙන යාම සඳහා හොඳින් සංවිධානය වී කටයුතු කිරීමට හැම සාමාජිකයෙකුටම වගකීමකුත් තිබෙනව.

## වී මිළදී ගැනීම

වී අලෙවි මණ්ඩලය වෙනුවෙන් සමුපකාර සමිති විසින් වී මිළදී ගන්නා විට ගෝනිය සඳහා අඩු කරන බර ප්‍රමාණය පලාතෙන්, පලාතට රාත්තල් 2 1/2 සිට රාත්තල් 5 දක්වා වෙනස් වන බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. මෙ ගැන අපි වී අලෙවි මණ්ඩලයෙන් කරුණු විමසා බැලුවා. ගෝනියේ බර හැටියට අඩු කළ යුතු ප්‍රමාණය වී අලෙවි මණ්ඩලය විසින් නියම කර තිබෙනවා. ඒ අනුව වී රාත්තල් 110 ක්

දැමිය හැකි ගෝනියකින් රාත්තල් 2 කුත්, රාත්තල් 140 ක් දැමිය හැකි ගෝනියකින් රාත්තල් 3 කුත්, ගෝනියේ බර හැටියට අඩු කළ යුතුයි. මීට වඩා ප්‍රමාණයක් අඩු කිරීමට වී මිලදී ගන්නා සමුපකාර සමිතිවලට බලයක් නැහැ.

එක් එක් ශ්‍රෙණිවලට වී වර්ග කිරීමේදී අනුගමනය කළයුතු පිළිවෙල වී අලෙවි මණ්ඩලය විසින් නියම කර තිබෙනවා. සාමාන්‍යයෙන් 6% කට අඩු බොල් ප්‍රමාණයක් තිබෙන තෙතමනය නැති වී පළමුවැනි ශ්‍රෙණියට ඇතුළත් වෙනවා. වී අලෙවි මණ්ඩලයේ උපදෙස් පිළි නොපදින සමුපකාර සමිති ගැන වී අලෙවි මණ්ඩලයට පැමිණිලි කිරීමට සැම ගොවි මහතෙකුටම අයිතියක් තිබෙනවා.

**පෝර — (අ) සිල්ලර වශයෙන් ලබාගැනීම, සහ (ආ) හඳුනා ගැනීම**

(අ) සමන්ගේ ගොයම් පැල තවාන් වලට යෙදවීම සඳහා විශේෂයෙන් යූරියා වැනි පෝර සිල්ලර වශයෙන් සමුපකාරයෙන් ලබා ගැනීම දුෂ්කර වැඩක් බව මහනුවර දිස්ත්‍රික්කයේ සමහර ගොවි මහත්වරු අප සමග කියා තිබියා. ඔවුන් කියන හැටියට සමුපකාරයේ විකිණීමට තිබෙන්නේ රාත්තල් 56 ක් සහ රාත්තල් 112 ක්වූ විශාල පෝර මලු. මේ ප්‍රශ්නය ගැන අප ශ්‍රී ලංකා පෝර සංස්ථාවෙන් විමසා බැලූ විට ඔවුන් කියා තිබියේ කුඩා පැකට්ටුවල පෝර ඇසිරීම නොකරන බවයි. ඊට හේතුව සංස්ථාව සතුව දැන් තිබෙන යන්ත්‍රවලින් කුඩා පැකට්ටුවල පෝර ඇසිරීම නොකළ හැකි නිසයි.

දැන් පෝර හිඟයක් තිබෙන නිසා, විශේෂයෙන් යූරියා නිකුත් කරනු ලබන්නේ සහනාධාර ක්‍රමය යටතේ පෝර ලබා ගන්න ගොවි මහත්වරුන්ට පමණක් බව පෝර සංස්ථාව වැඩිදුරටත් කියා සිටියා.

(ආ) සමුපකාරයෙන් විකුණන පෝර මලුවල සමහරවිට පෝර වර්ගයේ නම සඳහන් කර නැති නිසා කළමනාකරු කියන දෙය පිළි ගැනීමට සිදුවන බව ගොවි මහත්වරු කීප දෙනෙක් අප සමග පැවසුවා. මේ ගැන පෝර සංස්ථාවෙන් විමසා බැලූවිට අපට දැන ගන්නට ලැබුනේ පසුගිය නොවැම්බර්-දෙසැම්බර් මාසවලදී ටී. ඩී. එම්. මිශ්‍රණ සෑදීම සඳහා අවශ්‍ය පොටෑෂ් නමින් හැඳින්වෙන ද්‍රව්‍යයේ හිඟයක් තිබුන නිසා වෙන් වශයෙන් මිශ්‍රණයේ නම පෝර මලුවල සඳහන් නොකළ බවයි. මෙසේ කළේ තාවකාලික පියවරක් වශයෙන් බවත්, දැන් යලිත් කලින් තිබුන පිළිවෙලට වෙන් වශයෙන් මිශ්‍රණයේ නම පෝර මලුවල සඳහන් කරන බවත් වැඩිදුරටත් අපට දැන ගන්නට ලැබුනා.

---

## 'ගොවි ජනතාව' සඟරාව ගැන ඔබේ අදහස් මොනවාද

* එහි අඩංගු කරුණු ඔබට ප්‍රයෝජනවත්ද?
* එහි භාෂා ශෛලිය පහසුවෙන් තේරුම් ගැනීමට හැකි පරිදි පැහැදිලිද?
* 'ගොවි ජනතාව' සඟරාව ලබා ගැනීමට ඔබට අපහසු කමක් තිබේද ?

ඔබේ අදහස් දැන ගැනීමට අපි කැමැත්තෙමු.

**කරුණාකර සියළුම ලියකියවිලි පහත සඳහන් ලිපිනයට එවන්න.**

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 7.